www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික අපනයන කලාප කම්කරුවන් හට රැකියා හා වැටුප් කප්පාදුවෙන් පහර වදී

## Sri Lankan export zone workers hit by job and pay cuts

**සමන් ගුනදාස විසිනි**

**2009 ජුලි 14**

ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම යටතේ වැඩ පැය ගනන හා වැටුප්වල දරුනු කැපීමකට ශ්‍රී ලාංකික කම්කරුවෝ මුහුන දී සිටිති. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට (අයිඑල්ඕ) අනුව මෙම වසරේ පලමු කාර්තුව තුල 192,000 ක් සේවයෙන් ඉවත් කර ඇත.

ඔවුන් අතරින් 96,000 ක් කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් වන අතර ඇඟලුම් කම්කරුවන් 60,000 ක් ද ඉදිකිරීම් කම්කරුවන් 36,000 ක් ද වෙති. මෙම කම්කරුවන් හට අඩු වැටුප් සහිත සේවා ක්ෂෙත්‍රයේ රැකියාවන්ට යාමට හෝ ආපසු ඔවුන්ගේ ගම්බද නිවෙස් කරා යාමට බල කෙරී ඇත.

බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානයට එරෙහි රාජපක්ෂ ආන්ඩුවේ මිලිටරි ජයග්‍රහනය මගින් රැකියා හා කොන්දේසි වලට එරෙහි ප්‍රහාරයන් උත්සන්න කර ලෝක අවපාතයේ බර පැටවීම ඊට සමාන ලෙස කෲරව එල්ල කිරීමට හාම්පුතුන්ව උනන්දු කරවයි.

ප්‍රධාන වශයෙන් අපනයන සඳහා නිෂ්පාදනය කල කම්හල් 200 ක් පමන පසුගිය වසර තුල වැසී ඇත. පසුගිය සැප්තැම්බරයේ සිට ජනවාරි දක්වා රටේ නිදහස් වෙලඳ කලාප (නිවෙක) තුල සමාගම් 11 ක් වසා කම්කරුවන් 3,198 ක් ඉවත් කර ඇති බව අයිඑල්ඕ සංවිධානය වාර්තා කලේය.

රැකියා අහිමි වීමෙන් හා වැඩපල කොන්දේසි පිරිහීමෙන් තදින්ම පහර වැදී ඇත්තේ ඇඟලුම් කම්කරුවන් හට ය. ප්‍රධාන අපනයන වෙලඳ පල වන ඇමරිකාවේ හා යුරෝපයේ ඇනවුම් සිඳී යමින් පවතී. සේවයෙන් ඉවත් කිරීම් වැටුප් කැපීම් හා වැඩපල කොන්දේසි පහල හෙලීම් වලට කම්කරුවන් මුහුන දී ඇති බංග්ලාදේශය වියට්නාමය ඉන්දියාව හා චීනය වැනි අඩු වැටුප් සහිත රටවල් සමග ශ්‍රී ලංකාවේ පදනම් වී සිටින සමාගම් මිල යුද්ධයක පැටලී සිටී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2008 වාර්ෂික වාර්තාවට අනුව රටෙහි විශාලතම අපනයන ආදායම් උපයන්නා හා හාම්පුතා වන ඇඟලුම් ක්ෂේත්‍රය රට තුල වියදම් වැඩි වීමේ පීඩනය මධ්‍යයේ අඩු මිලට නිෂ්පාදනය කරන රට වල තියුනු තරගකාරිත්වයට මුහුන දී සිටී. ගෝලීය අර්බුදය උත්සන්න වීම සමග මිල පහත හෙලන ලෙස ඉල්ලීම් කෙරෙන අතර ඉදිරි ඇනවුම් තහවුරු කිරීමේ දී ප්‍රධාන ගැනුම්කරුවෝ පරෙස්සම් සහගතව ක්‍රියා කරති.

*ලෝසවෙඅ* යේ හා සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) කන්ඩායමක් කම්කරුවන්ගේ අත්දැකීම් සාකච්ඡා කිරීම සදහා ලංකාවේ දෙවන විශාලතම නිවෙකය වන කොලඹ සිට කි.මී. 24ක් දුරින් පිහිටි බියගම අපනයන සැකසුම් කලාපය වෙත පිවිසිනි.

1985 දී ස්ථාපිත කරන ලද මෙම කලාපය තුල කම්හල් 50ක් පමන ඇති අතර ප්‍රධාන වශයෙන් නිමි ඇඳුම් හා වියන ලද රෙදි හා ඇඟලුම් උපාංග නිෂ්පාදනය කරන්නාවූ කම්කරුවෝ 20,000 ක් පමන සිටිති. අනෙකුත් නිෂ්පාදනය කෙරෙන භාන්ඩ වන්නේ සැත්කම්වල දී භාවිත කෙරෙන අත් වැසුම් ඝන ටයර ජල ක්‍රීඩා සඳහා භාවිත කෙරෙන උපකරන මුද්‍රිත උපාංග හා ඉලෙක්ට්‍රොනික උපාංගවේ. ඇමරිකාව බ්‍රිතාන්‍යය ජපානය ඕස්ට්‍රේලියාව නෙදර්ලන්තය ජර්මනිය හා චීනය (හොංකොං) වැනි රටවලින් කර ඇති මෙම ආයෝජනයන් ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ කොටස් ය.

කලාපය කටු කම්බිවලින් වට කොට ආරක්ෂක සේවයන් යොදා පිටස්තරයන්ගේ පැමිනීම වලක්වා ඇති අතර යමෙකුට එහි ඇතුලු වීමට අවසර පතක් අවශ්‍යය. කලාපය තුල කම්කරු පෙලපාලි මැඩීම සඳහා පොලිස් මර්දනය දියත් කිරීමට එරෙහිව 1990 ගනන්වලදී පැන නැගුනු කලහකාරී කම්කරු අරගල යලි පැන නැගෙතැයි කම්හල් අයිතිකරුවෝ බිය වී සිටිති.

බොහෝ කම්කරුවන් කලාපයට පැමින ඇත්තේ පිටිසර ගම්මානවලිනි. 'අපි වවමු - රට නගමු' වැඩ පිලිවෙල සාර්ථකව දියත් කිරීම මගින් තරුන ජනයා හට හොඳින් ජීවත් විය හැකි ආදායමක් ලැබෙන බවට ආන්ඩුව ප්‍රචාරය කරයි. එනමුදු කලාපයේ සිටින කම්කරුවන්ට අනුව රටෙහි විශාලතම කෘෂිකාර්මික ක්ෂේත්‍රය වන වී ගොවිතැනින් ජීවත් වීමට සරිලන ආදායමක් සොයා ගැනීම අතිශය දුෂ්කර කටයුත්තකි.

ඇමරිකාවට හා යුරෝපයට ඇඟලුම් අපනයනය කරන ග්ලෝබල් ක්ලෝතින් කම්හලෙහි කම්කරුවන් තිදෙනෙක් කම්හලෙහි වැඩපල කොන්දේසි තව දුරටත් ඉවසිය නොහැකි තතු යටතේ වෙනත් කම්හලක රැකියාවකට යාමට තීන්දුකල බව ලෝසවෙඅ ට ප්‍රකාශ කලේය. කම්හලෙහි නිෂ්පාදන පේළි සංඛ්‍යාව 12 සිට 7 දක්වා ද කම්කරු සංඛ්‍යාව 500 සිට 200 දක්වා ද පහත හෙලා ඇත. වැටුප් ගෙවීමේ ප්‍රමාදයන් හා අතිකාල කැපීම් නිසා බොහෝ කම්කරුවන් ඉවත් වී ඇත.

17 වියැති ශ්‍රියා කියා සිටියේ අපොස (සාපෙ) විභාගය අවසන් කිරීම සමග ම ඇය ග්ලෝබල් ක්ලෝතින් කම්හලේ සේවයට බඳවා ගැනුනේ කොලඹට කි.මී. 216ක් දුරින් පිහිටි පොලොන්නරුවේ අරලගන්විල ගමෙහිදී බවය. දරිද්‍රතාවය හා කුඩා ගොවීන් මුහුන දෙන අර්බුදය තරුන ජනයාගේ අධ්‍යාපනය කඩාකප්පල් කරන්නේ කෙසේද යන්න පිලිබඳව ඇයගේ තත්ත්වය මගින් පැහැදිලි කෙරේ. පිටිසරබද පාසැල් වල පහසුකම් හා පුහුනු ගුරුවරුන් ඇත්තේ නැත. පහල ප්‍රමිතියකින් යුත් අධ්‍යාපන ක්‍රමයේ ගොදුරු වන මොවුහු අවසානයේ ලාභ ශ්‍රමය සොයන්නා වූ කම්හල් අයිතිකරුවන්ගේ ග්‍රහනයට හසුවෙති.

''පසුගිය දෙසැම්බරයේ කම්කරුවන් 60 දෙනෙකු ගෙන් යුත් බසයක මා මෙම කම්හලට පැමිනියේ යැ''යි ශ්‍රියා කියා සිටියාය. ''දෙමවුපියන් හට පවුල නඩත්තු කල නොහැකි බව අප දැන සිටි බැවින් මාත් මගේ සොහොයුරියත් මෙහි පැමිනියා. දැන් අප දෙදෙනා සෑම මසකම රුපියල් 10,000 ක් ඔවුන්ට යවනවා.

''සමාගම දුන් පොරොන්දුවලට පටහැනිව වැඩපල කොන්දේසි දිනෙන් දින පහත වැටෙනවා. අපට දහවල් කෑමට ලැබෙන්නේ පැය බාගයක් හා උදේ කෑමටත් සවස තේ සඳහාත් පැය කාල බැගින්. නියමාකාර විවේක කාමර හෝ සෞඛ්‍ය පහසුකම් කම්කරුවන්ට ඇත්තේ නැහැ.

''කලමනාකාරිත්වයට අනුව සමාගමේ අපනයන ඇනවුම් පහත වැටෙමින් තිබෙනවා. ඔවුන්ගේ ලාබය රැක ගැනීම සඳහා කම්කරු සංඛ්‍යාව අඩු කරමින් ඉතිරි කම්කරුවන් මත ඔවුන් බර පටවනවා. අප තීන්දු කලා මෙම රැකියාවෙන් ඉවත්ව රන්මලු ෆැෂන්ස් සමාගමේ රැකියාවකට යන්න. අප සිතුවා. එය අපට අතිකාල උපයිය හැකි වඩා හොඳ කම්හලක්ය කියා. නමුත් එහි තත්ත්වයත් පහත වැටෙමින් තිබෙනවා.''

ඇඟලුම් කම්කරුවන්ට අති කාල උපැයීම් වැදගත් වී ඇත්තේ රුපියල් 8,000 (ඇ.ඩො. 69) ක් පමන වන අඩු වැටුප නිසා වේ. කෙසේ වුවද ''හොඳ රැකියා'' දුර්ලබ වෙමින් පවතී.

රන්මලු ෆැෂන්ස්හි මාලිනී මෙසේ පැවසුවාය: ''කලමනාකාරිත්වය ඉලක්ක අතිශය දුෂ්කර මට්ටම්වලට ඉහල දමන බැවින් අපගේ රැකියාව අපහසු වෙමින් පවතී. අවම වශයෙන් පැයකට කෑලි 50ක ඉලක්කයක්වත් අප සැපිරිය යුතුයි. අප බෝඩිමට පැමිනෙන විට කෙතරම් වෙහෙසට පත්ව සිටින්නේ ද කිවහොත් රෑ කෑම පිලියෙල කර ගැනීම පවා අපහසුයි.'' කම්කරුවන්ට පැමිනීමේ දිරි දීමනාවක් දෙනු ලැබුව ද දින දෙකක් නොපැමිනියහොත් එය සම්පූර්නයෙන්ම කප්පාදු කෙරේ. දිනකට පැය 12ක් බැගින් සතියකට දින 6ක් වැඩ කලත් අති කාල දීමනා ද සහිතව මසකට රුපියල් 15,000 (ඇ.ඩො. 130) ට වඩා උපයිය නොහැකිය.

වෘත්තීය සමිතියක් ලෙස හෝ අන් අයුරකින් සංවිධානය වීමට කම්කරුවන් උත්සාහ කලහොත් සේවයෙන් ඉවත් කරන බවට හාම්පුත්තු තර්ජනය කරති. ආන්ඩුවේ පරීක්ෂකයින් පැමිනි විට වැඩපල කොන්දේසි පිලිබඳව ඔවුන්ට බොරු කිව යුතු අතර එසේ නොකල හොත් අස් කරන බවට තර්ජනය කල අවස්ථා ද ඇත.

ඇඟලුම් කම්හල්වලට ලේබල් හා උපාංග සපයන මුද්‍රන කම්හලක සේවය කරන දයා මෙසේ විස්තර කලාය. ''කෘෂිකාර්මික රැකියා වඩා හොඳ නම් අපි කිසි දිනක මෙම කලාපයන්ට නොඑන්නෙමු. අපගේ අති කාල දීමනා කැපුව ද වැටුප් වෙලාවට නොගෙව්ව ද අප රැකියා අත හැර නොයන්නේ අවම වශයෙන් අප අපගේ දෙමව්පියන්ට බරක් නොවිය යුතු නිසාය.''

රැකියාවක් අහිමි වීමෙන් පසු යලි ගම බලා යාම බේදවාචකයක් බව දයා විස්තර කලාය. ''වී ගොවිතැනින් ජීවත් වීම අතිශය දුෂ්කරයි. ගොවියෙක් වන මගේ තාත්තාගේ ආදායම අතිශය සොච්චමක්. ඔහු ගමේ මුදලාලිගෙන් ගොවිතැන් කිරීම සඳහා නයට මුදල් ගන්නවා. ගොවිතැන සඳහා යන වියදම අධිකයි. ආන්ඩුව සහනාධාර දෙන්නේ එක් වර්ගයක, එනම්, යූරියා පොහොර සඳහා පමනයි. සෑම අස්වැන්නක්ම නය ගෙවීමට වැය වෙනවා.''

බොහොමයක් කම්කරු තරුනියන් සැලසුම් කරනුයේ වසර කිහිපයක් වැඩ කර තම විවාහය සඳහා දෑවැද්ද හා රත්‍රං ආබරන කිහිපයක් එකතු කර ගෙන

ගමට යාමටය. ගොවිතැනින් ජීවත් වීමේ අපහසුව නිසා බොහෝ දෙනෙකුට සිය වයස්ගත මව්පියන් හට මුදල් යැවීමට සිදු වේ. වැඩ පරිමාව ඉහල යන අතරතුර වැටුප් පහල වැටීම නිසා මෙය වඩ වඩා දුෂ්කර වෙමින් තිබේ.

රෙදි නිෂ්පාදනය කරන්නාවූ චීන අයිතියෙන් යුත් ඕෂන් ලංකා කම්හලෙහි තරුන කම්කරුවෙකු වූ ජයන්ත පැවසුවේ කම්හලෙහි කම්කරු සංඛ්‍යාව 1,800 සිට 1,500 දක්වා අඩු කල බවය.

''අප කම්හල අනෙක් කම්හල් සඳහා රෙදි නිෂ්පාදනය කරයි. අපනයන ඇනවුම් පහත වැටීම නිසා පසුගිය මාස කිහිපය තුල ඇනවුම් අඩු වුනා. මා වැඩ කරන්නේ ගබඩා අංශය තුලයි. මෙම අංශය තුල කම්කරු සංඛ්‍යාව 50 සිට 40 දක්වා අඩු වුනා. අපගේ වැඩ පරිමාව ඉහල ගියද වැටුප එම මට්ටමේමයි.''

එම කම්හලෙහි ම සෝමසිරි ද සාකච්ඡාවට එක් විය. ''සොච්චම් වැටුප් වැඩි වීමකින් කිසිදු පලක් නැහැ.'' ඔහු පැවසීය. ''ඉහල යන ජීවන වියදම දරා ගැනීමට වැටුපට නොහැකියි.'' යුද්ධයේ අවසානය මගින් සහනයක් ගෙන එනු ඇතැයි යන ආන්ඩුවේ ප්‍රලාපයන් හුවා දක්වමින් ඔහු කියා සිටියේ ඒ වෙනුවට තත්ත්වය පිරිහෙමින් ඇති බවයි.

උතුරෙහි වවුනියාවේ කඳවුරු තුල දෙමල සිවිල් වැසියන් 300,000ක් අතිශය දුෂ්කර කොන්දේසි තුල සිර කරගෙන සිටින ආකාරය ලෝසවෙඅ කන්ඩායම විස්තර කලේය. සෝමසිරි මෙසේ පැවසීය. ''දෙමල සිවිල් වැසියන් මැඩීම ආන්ඩුව නැවැත්විය යුතුය. ආහාර මෙන්ම ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද ඔවුන්ට දිය යුතුය.''

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ''බඩට පෙර රට'' යන ආර්ථික අර්බුදය නිසා කම්කරු ජනතාව සිය පටි තද කර ගත යුතු බව පවසන ජාතිකවාදී ප්‍රලාපය සෝමසිරි විවේචනය කලේය. ''ආන්ඩුවක් ඇත්තේ ජනතාවට වඩා හොඳ ජීවන කොන්දේසි සලසා දීමට මිස ඔවුන්ට අඩන්තේට්ටම් කිරීමට හා ඔවුන්ව දුප්පතුන් කිරීමට නොවේ.''

සසප සාමාජිකයන් විසින් විස්තර කරනු ලැබූ ජාත්‍යන්තර සමාජවාදී වැඩ පිලිවෙලට ඕනෑකමින් සවන් දුන් බොහෝ කම්කරුවන් එවන් ජාත්‍යන්තර පක්ෂයක් ගොඩ නගන්නේ කෙසේද ලෝකය පුරා සමාජවාදය සඳහා සටන්වැදීම අවශ්‍යවන්නේ ඇයි යනාදී ප්‍රශ්න නැගුහ.

© www.wsws.org